# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2493/09 - 2026 ජුනි මස 16 වැනි අඟහරුවාදා - 2026.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 130972 දරන සහ අංක 10, රේමන්ඩ් පාර, නුගේගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන "ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 දෙසැම්බර් මස 13 දින අංක 2362/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

(1) ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී, ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරය) සම්බන්ධයෙන් ;

1.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ එක් අවස්ථාවකදී පහත (අ) කාණ්ඩයේ විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3)ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;

(අ)
- i. ව්‍යාපාර අධ්‍යයනය
- ii. ආර්ථික විද්‍යාව
- iii. ගිණුම්කරණය;

හෝ

1A - PG 7748 - 283 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1.2 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එක් අවස්ථාවකදී (අ) කාණ්ඩයේ විෂයයන් අතරින් අවම වශයෙන් විෂයයන් දෙකක් (02)ක් සහ තෙවන විෂය වශයෙන් (ආ) කාණ්ඩයේ විෂයයන් අතරින් එක් විෂයයකට (01) වන පරිදි සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3)ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;

(ආ)
i. කෘෂි විද්‍යාව
ii. භූගෝල විද්‍යාව
iii. ව්‍යාපාර සංඛ්‍යානය
iv. ජර්මන්
v. සංයුක්ත ගණිතය හෝ ගණිතය
vi. ඉතිහාසය
vii. දේශපාලන විද්‍යාව
viii. ඉංග්‍රීසි
ix. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
x. ප්‍රංශ
xi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

3. ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය සඳහා මෙම නියමය පළ කරන ලද දිනයේ සිට වසරක් ඇතුළත සිසුන් ඇතුළත් කර ගත යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය | බීබීඒ ගෞරව |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 ජූනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0200